10 ශ්‍රේණිය

# පෙරදිග සංගීතය

## නාදයේ ගුණ දැන ගනිමු.



අන්තර්ගතය - T.A.I.A විජේසිංහ- ගුරු උපදේශිකා - හෝමාගම අධ්‍යාපන කලාපය
සැකසුම - P.I.R මුතුකුමාරණ - මො/මැදිරිය රාජ්‍යානන්ද ම.ම. විද්‍යාලය , මොනරාගල

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## නාදයේ ස්වභාවය හඳුනා ගනිමු

සංගීත විෂය හදාරන අපි "ස්වර" යනු එකිනෙකට වෙනස් වූ නාද බව දනිමු. ස්වර සප්තකය ගොඩ නැගී ඇත්තේ එම නාද අනුපිළිවෙලට සංවිධානය කිරීමෙනි.

එක් එක් අයගේ කට හඬ එකිනෙකාගෙන් අනන්‍ය බව ද, එමෙන්ම සංගීත භාණ්ඩ වල හඬ එකිනෙකින් වෙනස් බව ද , එකම හඬත් සිහින්ව හා බරව උත්පාදනය කළ හැකි බව ද, නැතහොත් එකම නාදය උස් හඬින් මෙන්ම පහත් හඬින් ද ඇති කළ හැකි බව ද එක් නාදයකින් තවත් නාදයක් වෙන්කොට ගත හැකි පරිදි විවිධ නාද ඇති බව ද අපි දනිමු.

මේ සියල්ල නාදයේ ගුණාංග වේ.


Copyright © e-thaksalawa.moe.gov.lk

## නාදයේ ත්‍රිවිධ ගුණ

පෙරදිග සංගීතඥයන් මීට වසර සිය ගණනකට පෙර නාදයේ විවිධ ප්‍රභේද හඳුනාගත් අතර , ඒ පිළිබඳව ඔවුන් විවිධ මත පලකර ඇත.

මේ පිළිබඳව විවිධ මත පල වූ වත් භෞතික විද්‍යාත්මකව පිළිගත් පරිදි නාදයේ ගුණ තුන් ආකාර බව නවීන සංගීතඥයින්ගේ මතයයි.

1. තාරතාවය - උච්චනීච ප්‍රභේදය (Pitch)
2. විපුලතාවය - රූප භේදය (Magnitude)
3. ධ්වනි ගුණය - ජාති භේදය (Timber)


Copyright © e-thaksalawa.moe.gov.lk

## තාරතාවය

නාදයන්ගේ සංඛ්‍යාත වෙනස්වීම නිසා එක් නාදයක් තවත් නාදයකින් වෙන්කොට හඳුනාගත හැකිය. මෙම ගුණය නාදයේ තාරතාවය ලෙස හඳුන්වයි. සංගීතයේ දී මෙය උච්චනීච භේදය ලෙස ද හඳුන්වයි. මේ පිළිබඳව තව දුරටත් පැහැදිලි කර ගැනීම සඳහා පහත උදාහරණ බලමු.

"ස,රි,ග"ස්වර ගයමු වයමු.

සඩ්ජයට වඩා රිෂභයේ හඬ ඉහළය. මෙම ස්වර ගායනය/වාදනය කිරීමේ දී තත්පරයක් තුළ සිදුවන කම්පන වාර ගණන ද පෙර අවස්ථා වලට වඩා ක්‍රමයෙන් වැඩිය. එනම් 'ස' ස්වරයේ සංඛ්‍යාතය වඩා 'රි' ස්වරයේ සංඛ්‍යාතය වැඩිය. ඊට වැඩි 'ග' ස්වරයේ සංඛ්‍යාතය වැඩිය.

මෙලෙස කම්පනය වේගවත් වීම හේතුවෙන් සිදුවන සංඛ්‍යාතයේ වැඩිවීම නිසා එක් නාදයක් තවත් නාදයකින් වෙන් කර හඳුනාගත හැකි වේ.

මෙය නාදයේ තාරතාවයයි.


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## තාරතාවය කෙරෙහි බලපාන සාධක

ඇදි තතක ,

- ❖ ආතතිය
- ❖ දිග
- ❖ ඝනකම

ඇදි පටලයක ,

- ❖ ආතති
- ❖ වර්ග ඵලය
- ❖ ඝනකම


e තක්සලාව
The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

තාරතාවය අඩු හා තාරතාවය වැඩි නාද තරංග සටහන් කිහිපයක් පහත දැක්වේ.





Copyright © e-thaksalawa.moe.gov.lk

## විපුලතාවය

නාදයේ අඩු වැඩි බව නැතහොත් හඬේ සැර විපුලතාවයයි. මෙය සංගීතයේ දී රූප භේදය ලෙස හඳුන්වයි. මෙහිදී සිදුවන්නේ නාද උත්පාදනයට යොදන බර අඩු වැඩි වීම නිසා තරංගයේ විස්තාරය අඩු වැඩි වී ඊට අනුරූපව හඬ අඩු වැඩි වීමයි.

එකම නාදය උස් හඬින් හෝ පහත් හඬින් ඇති කළ හැකිය. තබ්ලාවේ බයාවට හඬ විහි දී යන සේ වැරෙන් පහරක් ගසන්න. එවිට එම හඬ ඈතට පැතිරී යයි. එවිට හඬ ඈතට ඇසේ. එම අවස්ථාවේදී ම එම තත්වයන් යටතේම බායාවට සෙමින් තට්ටු කරන්න. එම හඬ ඈතට නොපැතිරේ. එම හඬ ළඟට පමණක් ඇසේ.

නාද උත්පාදනය සඳහා,

- යෙදූ බලය අනුව
- ශක්ති ප්‍රමාණය අනුව

පැතිරීම දෙයාකාර වේ.


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

නාද උත්පාදනයට වැදෙන පහර දුර්වල නම් කම්පනය වීම අඩුය. හඬ අඩුය. නාද උත්පාදනයට වැදෙන පහර ප්‍රබල නම් කම්පනය වීම වැඩිය. හඬ ද වැඩිය.

මෙහි දී සිදු වන්නේ කම්පන වාර ගණන අඩු වැඩි වීම නොවේ.

වයලීනයක් ගෙන සෙමින් වාදනය කරන්න. එම වාද්‍ය භාණ්ඩයම නැවත වැඩි බරක් යොදා වාදනය කරන්න. එවිට ඈතට ඇසෙන බව අවදානයට ලක් කරන්න. දුරට ඇසුනේත්, ළඟට ඇසුනේත් එකම නාදයයි.

මෙය නාදයේ විපුලතාවයයි. මෙහි දී ස්වරයේ සංඛ්‍යාතයට බලපෑමක් සිදු නොවේ. මෙහි දී බලපෑම සිදුවන්නේ පැතිරීමේ ප්‍රමාණයටයි. නැතහොත් තරංගයේ විස්තාරයටයි.


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

එවැනි අවස්ථාවක තරංග සටහනට සිදුවන බලපෑම පහත රූප සටහන ඇසුරින් අවබෝධ කර ගනිමු.





Copyright © e-thaksalawa.moe.gov.lk

# ධ්වනි ගුණය

මෙම ගුණය ජාති භේදය ලෙස හඳුන්වයි. කැසට් පටයකට , ගීතයකට සවන් දෙන විට එම ගීතය ගයන ගායකයා/ගායිකාව, එමෙන්ම එම ගීතය සඳහා සහය වාදනය සිදු කරන සංගීත භාණ්ඩ හොඳින් හඳුනා ගැනීමේ හැකියාව ලැබේ. ඊට හේතුව එක් එක් පුද්ගලයාගේ කට හඬේ විවිධත්වය හා එක් එක් භාණ්ඩවල ඇති ධ්වනීන්ගේ සුවිශේෂී ගුණයයි.

විවිධ භාණ්ඩ වලින් එකම ස්වර ලිපිය වාදනය කළ ද අපට එම භාණ්ඩ වල නාද ඇසීමෙන් පමණක් භාණ්ඩ වෙන් වෙන්ව හඳුනාගත හැකිය. එක් එක් භාණ්ඩයේ නාද එකිනෙකට වෙනස්ය.

සංගීත භාණ්ඩවල,

- දිග
- පළල
- තත්වල ඝනත්වය

ආදී නොයෙකුත් හේතූන් ධ්වනි ගුණය කෙරේ බලපායි.


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

එමෙන්ම,

- භාණ්ඩ නිර්මාණයට යොදාගත් අමුද්‍රව්‍ය
- භාණ්ඩ වල හැඩය

ආදිය ද මේ කෙරේ බලපායි.

පුද්ගලයෙකුගේ කටහඬ කෙරේ,

- ගැහැණු / පිරිමි බව
- ස්වරාලයේ ප්‍රමාණය
- මුහුණේ මාංශ පේශි
- මුඛයේ ප්‍රමාණය
- දත් පිහිටීම
- උගුරේ ප්‍රමාණය
- බෙල්ලේ පිහිටීම

ආදිය බලපායි. ඒ අනුව හඬ විවිධත්වය ඇති වේ.

මෙලෙස භාණ්ඩයකින් භාණ්ඩයට ධ්වනියේ ඇති වෙනස් බව , කට හඬේ ඇති වෙනස ධ්වනි ගුණය ලෙස දැක්විය හැකිය.


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

හඬ වෙන්කර හඳුනා ගැනීමට තරංග රාටාවේ වෙනස හේතුවේ.





Copyright © e-thaksalawa.moe.gov.lk